# පුරාණ ආරාම සංකීර්ණ තුළපැවති පොකුණු (අනුරාධපුරයේ අභයගිරි විහාර පරිශ්‍රය ඇසුරින් විමසුමක්)

**ජේ.පී.ඩී. රත්නායක**
මධ්‍යම සංස්කෘතික අරමුදල, අභයගිරි ව්‍යාපෘතිය, අනුරාධපුර.
*1974dammikakaru@gmail.com*

ප්‍රමුඛ පදඃ පොකුණ, ජලය, අභයගිරිය, අලංකාර, පිරිසිදු

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ බෞද්ධාගම ස්ථාපිත වීමත් සමග අනුරාධපුර රාජකීය පරිශ්‍රය වටා රාජ්‍යය අනුග්‍රහය ඇති ව මහාවිහාර සම්ප්‍රදයට අයත් විහාරාරාම නිර්මාණය වීමට පටන් ගත් අතර මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය, මිහින්තලේ ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදී. සාහිත්‍යය මූලාශ්‍රය වල සඳහන් ඉහත කී ස්මාරක වර්තමාන පුරාවිද්‍යාත්මක පර්යේෂණ වලින් ද තහවුරු වී ඇත. වර්තමානඅභයගිරි විහාර භූමිය ක්‍රිස්තු පූර්ව 89-77 කාලයේ රජ කළ වට්ටගාමණී අභය රජතුමා විසින් ඉදිකරන ලද (ම.ව. 33:83) අතර විවිධ රාජ්‍යය පාලකයන් යටතේ සංවර්ධනයට පත්විය. ස්තූපය මූලික කරගත් ආරාම සංකීර්ණයක් වන මෙහි පොහොය ගෙය, ප්‍රතිමා ගෘහ, බෝධිඝර, දනශාලා, සන්නිපාතශාලා, ආවාස ගෘහ, පිරිවෙන්, දළඳ මැදුර, ජන්ථාඝර මෙන් ම පොකුණු 65 කින් ද සමන්විත වේ.

ජලය එක්රැස්කර ගැනීම සඳහා කිසියම් මානව මැදිහත් වීමකින් විවිධ අංග එකතු කොට නිර්මාණය කර ගන්නා ආවාටය පොකුණ යනුවෙන් හැඳින්විය හැකි ය. මෙය පොක්කරණි, පුෂ්කරණි, තටාකය, ආදී නම් වලින් ද හඳුන්වනු ලැබේ. ක්‍රිස්තු පූර්ව 3,000 දී පමණ මොහෙන්දජාරෝවෙන් ද දිග, පළල අඩි 39×23 ප්‍රමාණයේ ගැඹුර අඩි 8ක් වන බදාම කැපූ මනහර ගඩොලින් නිමවන ලද පැරණි දිගටි නාන පොකුණක් සොයාගෙන ඇත. (බෂාම් 1965:21) ලක්දිව පුරාණ ආරාම අතුරින් අලංකාර හැඩයේ පොකුණු නිර්මාණයන් ගෙන් සුසැදි ආරාම සංකීර්ණයක් ලෙස අභයගිරිය හැඳින්විය හැකි ය.

වර්තමාන පර්යේෂණ වලට අනුව විහාර සංකීර්ණය තුළ මෙතරම් විශාල පොකුණු ප්‍රමාණයක් නිර්මාණය වීමේ අවශ්‍යතාව කුමක් ද? මේ තුළින් සපුරාගත්තේ මිනිසාගේ මූලික ජල අවශ්‍යතා වන බීම සහ ස්නානය පමණක් ද? විමසා බැලීම පර්යේෂණ ගැටලුව වන අතර අභයගිරි සංකීර්ණය සතු පොකුණු වල කාර්යභාරය හඳුනාගැනීම මෙහි අරමුණ වේ.

අභයගිරි විහාරය අයත් කලාපයට ආවේණික පොදු දේශගුණික සාධක ලෙස, ඊසාන දිග මෝසම් සුළංවලින් අවුරුද්දේ එක් කාලයකට පමණක් වර්ෂාව ලැබීම සහ වර්ෂාව ලැබීමේ අවිනිශ්චිත බව සඳහන් කළ හැකි ය. අනෙකුත් විහාරවලට වඩා උස් භූමියක පිහිටීම නිසා භූගත ජලයේ ඌනතාව, වැව් පිහිටා තිබුනේ තරමක් දුරින් වීම නිසා ජලය ලබාගැනීමේ අපහසුව, ප්‍රදේශයේ එකම ස්වභාවික ජල මූලාශ්‍රය වූ මල්වතු ඔය ජේතවනය හා මහා විහාරයට ආසන්නයෙන් ගලා ගිය ද, අභයගිරියට දුරින් පිහිටීමත්, නිසා මෙහි ජල හිඟය මගහරවා ගැනීමට ජලය සම්පාදනය කර ගැනීමට අවශ්‍ය විය. ජල සම්පාදනයේ දී වර්ෂා ජලය කළමනාකරණය, මෙන් ම සම්පාදිත වාරි ජලය ලබාගත් බවට ද සාක්ෂි ලැබේ. භූගත ජලය ලබාගෙන ඇත්තේ අල්ප වශයෙනි.

**ක්‍රමවේදය**

පුස්තකාල පරිශීලනය, හා ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, පර්යේෂණයට යොදාගත් ක්‍රමවේදය විය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

අභයගිරි සංකීර්ණය සතු අති විශාල පොකුණු ප්‍රමාණය අධ්‍යයනය කිරීමේ දී, පරිභෝජනයට ජලය රැස්කිරීම, අපතේ යන ජලය එක්රැස්කර තබාගැනීම, පරිසර අලංකාරය, පරිසරය සිසිල් කරගැනීම ආදී කාර්යයන් සිදුකර ඇත.

පානය කිරීමට සහ ස්නානය සඳහා ජලය රැස්කරන ලද ප්‍රමුඛ පෙළේ නිර්මාණ තාක්ෂණය හා කලාත්මක බවින් උච්ච ස්ථානයක් ගන්නා පොකුණක් ලෙස කුට්ටම් පොකුණ හඳුන්වා දිය හැකි ය. මෙය අභයගිරි සංකීර්ණයට අයත් කපාරාමුලයේ වැඩ විසූ භික්ෂූන් උදෙසා ජල පහසුකම් සපයා ගැනීමට භාවිත වූවක් ලෙස විශ්වාස කෙරේ. ඉතා සූක්ෂම ආකාරයට සකස් කරන ලද ශිලා තීරුවලින් නිර්මිත යුගලයක් වනපොකුණ මීටර 40×16 සහ 28×16 ප්‍රමාණයෙන් යුක්ත ය. උතුරු දෙසින් උස් මට්ටමේ වූ කුඩා පොකුණ හා දකුණු දෙසින් පහළින් වූ විශාල පොකුණ වේ. පොකුණු සීමාව මතුපිට පියයක් මත සවිකරන ලද පුන්කළස් හා ජ්‍යාමිතික මෝස්තර වලින් හෙබි දෙරටු, පොකුණ පතුළ දක්වා ම වේ.

වයඹ මුල්ලෙහි ඇති භූගත ජල මාර්ගයෙන් පැමිණෙන ජලය ශිලා කොටුවකට වැටී ඒ වටා ඇති කාණුව දිගේ ගමන් කොට රොන්මඩ ඉතිරි වී ඊළඟට ඇති ශිලා කොටුවකට තැනින් තැන වූ පිහිළිවලින් පෙරී ගමන් කරයි. එම ජලය නැවත පෙරී ඊට ඉහළින් වූ කවුළුවෙන් (spout) පිරිසිදු ජලය බවට පත්ව උතුරින් වූ කුඩා පොකුණට ගමන් කරයි. මෙම ජලය එම පොකුණට එකතු වී එයින් ද රොන්මඩ යට තැන්පත් වී නැවත මෙහි ඇති කවුළුවලින් භූගත මාර්ගයකින් දකුණින් වූ පොකුණට ගමන් කරයි. එවිට බීමට සුදුසු පිරිසිදු ජලය දෙවැනි පොකුණින් ලබාගත හැකි ය.

මීටර 159 × 53 × 9 ප්‍රමාණයෙන් යුත්, කාර්යයන් රැසක් සඳහා භාවිත වූ පොකුණක් ලෙස ඇත් පොකුණ හඳුන්වා දිය හැකි ය. මෙහි බටහිර ඉවුර ස්වභාවික ගල් තලාවකට සම්බන්ධ වන අතර කුස්තුර පිහිටන සේ ගල් කුට්ටිවලින් බැඳ තිබෙන්නේ ස්වභාවික ජලය පෙරී පොකුණට පිරිසිදු ජලය ලෙස එකතු වීම පිණිස විය යුතුය.

පුළුල් වූ පියගැට පෙළක් සිව් දිශාවෙන් ම වන අතර එය අවසාන ජල බිංදුව ද ලබාගැනීමට හැකිවන පරිදි පතුල හා සම්බන්ධ වේ. ආසන්නයේ වූ ජල මූලාශ්‍ර 3කින් පොකුණට ජලය ලබාගෙන ඇති අතර දකුණු දෙසින් ගඩොලින් කළ බිසෝ කොටුවකින් ජලය පෙරී එන ලෙස සකස්කළ නිර්මාණයක් ද, උතුරු දෙසින් මාර්ග දෙකක් ද දක්නට ලැබේ. උතුරු දෙසින් වූ පෙරිමියන්කුලම වැව පිරුණු අවස්ථාවක එක් ජල පිහිල්ලක් සක්‍රිය වූ බවට තොරතුරු ඇත (කුලතුංග, 2014:259). ජල පිහිල්ල සිංහ මුඛයක කැටයමින් අලංකාර කර ඇත. එය නැවත ගල් තීරුවක් මතට වැටී ජලය වැටෙන ශබ්දය ඇසෙන සේ නිමවීම තුළින් ස්වභාවික අලංකාරය ඇති කර තිබේ.

අපතේ යන ජලය එක්රැස්කර තබා ගැනීම තුළින්, පරිසර අලංකාරය හා පරිසරය සිසිල් කරගැනීම යන කාර්යයන් ඉටුකර ගැනීම ද අභයගිරි විහාර භූමිය තුළ වූ පොකුණු වලින් සිදු වූ බව ස්තූපයෙහි ද්වාර මණ්ඩප අසල වූ පොකුණු සතරින් පැහැදිලි වේ. අක්කර 14ක් පමණ වන අභයගිරි ස්තූප පරිශ්‍රයට වර්ෂාව මගින් පතිත වන විශාල ජලස්කන්ධය නිකරුණේ ගලා යාමට ඉඩ නොදී සුරක්ෂිත කර ගැනීමට මෙම පොකුණු භාවිත කර ඇත. වර්ෂා ජලය එක්රැස් කර ගැනීම මෙන් ම පාංශු ඛාදනය වැළැක්වීමත් සමග පරිසරය ආරක්ෂා කිරීමත්, උසස් තාක්ෂණයක් භාවිතයෙන් මෙම ජල ස්කන්ධය ක්‍රමානුකූල ව පොකුණු කරා රැගෙන ගිය ආකාරයෙන් පෙනේ. ස්තූපයේ උපරි කොටසට වැටෙන වැසි ජලය සලපතළ මළුවට පතිත වී රැළි ක්‍රමයකට ඇතුළු ප්‍රාකාරයට සම්බන්ධ පිහිළි කරා ගෙන යාමට සලස්වා ඇත. මෙහි මධ්‍යයේ සෙ.මී. 5ක පමණ පියවි ඇසට නොපෙනෙන සියුම් බෑවුමක් වන පරිදි ස්තූප පාදමේ සිට ඇතුළු ප්‍රාකාරය දක්වා සෙ.මී. 30ක බෑවුම වේ (සැලසුම). ඇතුළු ප්‍රාකාරයේ පිහිලි හරහා වැලි මළුවට වැටෙන ජල කඳ පිටත ප්‍රාකාරයෙන් පොකුණු කරා ඇති කාණුව දිගේ ගොස් එකතු වී සුරක්ෂිත වේ.

ස්තූපයට යන දකුණු පිවිසුම් මාර්ගයේ වම්පසින් වූ ආයත චතුරස්‍රාකාර අලංකාර පොකුණක් හා දකුණු පසින් ගඩොලින් කළ ළිඳක් වැනි පොකුණ, රවුම් හැඩය හා පඩිපෙළත් සමග ගත්කළ යතුරක හැඩය ගන්නා අලංකාර නිමාවකි. උල්පත් මගින් ජලය පිරෙන මෙය සන්නිපාත ශාලාවට රැස්වන පිරිසගේ පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීමට ළිඳක් ලෙස භාවිත කරන්නට ඇත.

උත්තර මූලයේ විසූ භික්ෂූන් ගේ පැන් පහසුව සඳහා යොදාගන්නට ඇතැයි සිතිය හැකි ස්වර්ණපුලක පිණ්ඩ හමු වූ පොකුණ ද අලංකාර පොකුණකි. ඉවුර පඩිපෙළක ආකාරයට නිමවා ඇත්තේ හිඟ කාලයට ජලය ලබා ගැනීම පිණිස විය යුතු ය. පියගැට පෙළට බටහිරින් පිහිටිගල මත නිර්මාණය කළ ළිඳ, පොකුණෙන් පෙරී ආ පිරිසිදු ජලය ලබා ගැනීමට යොදගත් උපක්‍රමයක් විය හැකි ය.

ලංකාරාම සංකීර්ණයට එකතු වන ජලය ද ක්‍රමානුකූල ව එහි ඊසාන දිශාවේ වූ පොකුණකට ගලා බැස්ස බව මැටිවලින් කළ භූගත ජල මාර්ගය අනාවරණය වීමෙන් තහවුරු වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


සුමංගල භික්කඩුවේ ශ්‍රී සහ දේවරක්ෂිත බටුවන්තුඩාවේ, මහාවංශය (2014), (සංස්) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ.

කුලතුංග, ටී.ජී. (2014), පුරාණ අභයගිරි විහාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල

බෂාම්, ඒ.එල්. (1965), අසිරිමත් ඉන්දියාව, කොළඹ.